# 2026 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.

# පන්විල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම් භාණ්ඩ/ද්‍රව්‍ය/සේවා සඳහා සුදුසුකම්ලත් නිෂ්පාදකයින්,ආයතන හා පුද්ගලයින්ගෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම පිණිස මා විසින් 2025.11.24 දින සිට අයදුම්පත් භාර ගනු ලැබේ.

උපලේඛනයේ දැක්වෙන පරිදි කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වීමට ඉදිරියේ දක්වා ඇති ගාස්තුව සමඟ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමයේ ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය. සේවා සපයා ගැනීමේදී කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවන අතර හදිසි අවස්ථාවලදී බාහිර කොන්ත්‍රාත්කරුවන්ගෙන්ද සේවා ලබා ගැනීමේ අයිතිය ප්‍රාදේශීය සභාව සතුව පවතියි.

සැපයුම්කරුවන් සඳහා ලියාපදිංචි ගාස්තුව එක් අයිතමයක් සඳහා රු.1500.00 කි. එක් එක් අයිතමය සඳහා වෙන වෙනම ලියාපදිංචි ගාස්තු ගෙවිය යුතු අතර චෙක්පත් හා මුදල් ඇණවුම් මගින් ගෙවන්නේ නම් **"සභාපති,පන්විල ප්‍රාදේශීය සභාව"**යන නමින් එම මුදල් ගෙවිය යුතු වේ. චෙක්පත් හෝ වෙනත් අන්දමින් මුදල් ගෙවන අවස්ථාවේදී මුදල් උපලබ්ධි වනතෙක් ලියාපදිංචි කිරීම සිදු කරනු නොලැබේ.

අයදුම්පත්‍රය කාර්යාල වේලාවන් තුලදී පන්විල ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් හෝ අපගේ https://panwila.ps.gov.lk නිල වෙබ් පිටුව වෙත පිවිස බාගත කර ගත හැකි අතර සියලු විස්තර **Panwila PS** අපගේ නිල **ෆේස්බුක්** පිටුව මගින්ද දැනගත හැකිය. අයදුම්පත්‍ර 2025.12.30 දිනට පෙර ප්‍රධාන කාර්යාලයට භාරදීමෙන් හෝ ලියාපදිංචි තැපැල මගින් ලැබීමට සැලැස්විය යුතුය.ලියාපදිංචි ගාස්තු කාර්යාලයට සෘජුවම ගෙවීමටද හැකියාව පවතී.

## 01) සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු

| | සැපයුම් භාණ්ඩ/ද්‍රව්‍ය/සේවා | ලියාපදිංචි ගාස්තුව |
|---|---|---|
| I. | කාර්යාලයීය ලිපි ද්‍රව්‍ය, පරිගණක ආශ්‍රිත ලිපි ද්‍රව්‍ය | 1500.00 |
| II. | පුවත් පත් සැපයීම | 1500.00 |
| III. | මුද්‍රණ කටයුතු ලේඛන, ආකෘති, | 1500.00 |
| IV. | පෝස්ටර්, බැනර්,කොඩි,ඩිජිටල් ප්‍රින්ටින් | 1500.00 |
| V. | නිල මුද්‍රා,නාම පුවරු,දින මුද්‍රා,ප්ලාස්ටික් නාම පුවරු, රබර් මුද්‍රා | 1500.00 |
| VI. | කාර්යාල උපකරණ, ලී බඩු හා ගෘහ භාණ්ඩ ( මේස,පුටු,කැබිනට්,රාක්ක, අල්මාරි ආදිය) | 1500.00 |
| VII. | ගෘහ උපකරණ, ප්ලාස්ටික් බඩු, සහ මුළුතැන්ගේ උපකරණ | 1500.00 |
| VIII. | ගෘහ විදුලි උපකරණ සැපයීම ( විදුලි පංකා, වායු සමීකරණ. විදුලි ලාම්පු,විදුලි බුබුළු ආදිය) | 1500.00 |
| IX. | ගෘහ විදුලි උපකරණ අලුත්වැඩියාව | 1500.00 |
| X. | කාර්යාල උපකරණ, ලී බඩු හා ගෘහ උපකරණ අලුත්වැඩියාව. | 1500.00 |
| XI. | ඖෂධ හා වෛද්‍ය උපකරණ සැපයීම. | 1500.00 |
| XII. | ජලනල උපාංග හා ජල මනු සැපයීම | 1500.00 |
| XIII. | සනීපාරක්ෂණ උපකරණ, කෘෂි උපකරණ සැපයීම | 1500.00 |
| XIV. | විදුලි උපකරණ සැපයීම. (වයරිං කිරීම සඳහා) | 1500.00 |
| XV. | වාහන අමතර කොටස් සැපයීම | 1500.00 |
| XVI. | ටයර්,ටියුබ් සැපයීම. | 1500.00 |

| | | |
|---|---|---|
| XVII. | වාහන සර්විස් කිරීම. | 1500.00 |
| XVIII. | වාහන අළුත්වැඩියා කිරීම. | 1500.00 |
| XIX. | වාහන මීට් කවර දැමීම හා කුෂන් වැඩ | 1500.00 |
| XX. | කොන්ක්‍රීට් නිෂ්පාදන ද්‍රව්‍ය,හියුම් පයිප්ප,බීරළු,පිළිම ,සමරු ඵලක | 1500.00 |
| XXI. | ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය,තීන්ත, සෙවිලි තහඩු හා උපාංග | 1500.00 |
| XXII. | ආහාර කෙටි කෑම බීම සංග්‍රහ ද්‍රව්‍ය සැපයීම. | 1500.00 |
| XXIII. | රෙදිපිළි (නිළ ඇඳුම් හා පළඳනා, තිර රෙදි, මේස රෙදි,<br>ඇඳ ඇතිරිලි ආදිය)සැපයීම | 1500.00 |
| XXIV. | දැව සැපයීම | 1500.00 |
| XXV. | කොන්ක්‍රීට් මිශ්‍රණ (ready mix) | 1500.00 |
| XXVI. | සූර්ය කෝෂ (sola power) | 1500.00 |
| XXVII. | වඩු කර්මාන්ත ආශ්‍රිත යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 1500.00 |
| XXVIII. | මෝටර් ග්‍රේඩර්,තලන යන්ත්‍ර,JCB,කුලියට සැපයීම | 1500.00 |
| XXIX. | මිනින්දෝරු සේවා හා නීතිඥ සේවා සැපයීම. | 1500.00 |
| XXX. | පරිගණක හා පරිගණක උපාංග සැපයීම | 1500.00 |
| XXXI. | පරිගණක මෘදුකාංග සැපයීම හා ස්ථාපනය කිරීම | 1500.00 |
| XXXII. | ටෝනර්/රිෆිලින්/කාඩ්රිජ්/රිබන් සැපයීම | 1500.00 |
| XXXIII. | ට්‍රේලර්, අත්කරත්ත, ජල බවුසර් කුලියට සැපයීම | 1500.00 |
| XXXIV. | පරිගණක උපකරණ සේවා කිරීම හා අලුත්වැඩියාව | 1500.00 |
| XXXV. | ඡායා පිටපත් යන්ත්‍ර සේවා කිරීම හා අලුත්වැඩියාව | 1500.00 |
| XXXVI. | සෙරමික් උපාංග සැපයීම | 1500.00 |
| XXXVII. | ටෙන්ට් රෙදි සැපයීම | 1500.00 |
| XXXVIII. | සියලුම වර්ගයේ වීදුරු (දොර ජනේල,මේස,කණ්නාඩි ආදිය) සැපයීම | 1500.00 |
| XXXIX. | ආරක්ෂිත කැමරා පද්ධති සවි කිරිම හා නඩත්තුව | 1500.00 |
| XL. | ගස් කපන්නන් (අනතුරුදායක ගස් කපා ඉවත් කිරිම) | 1500.00 |
| XLI. | කෘමි නාශක ද්‍රව්‍ය සැපයීම සඳහා | 1500.00 |
| XLII. | සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයීම සඳහා | 1500.00 |
| XLIII. | විවිධ සේවා සඳහා සැපයුම්කරුවන් සැපයීම | |
| | • මේසන් වැඩ සඳහා | 1500.00 |
| | • වඩු වැඩ සඳහා | 1500.00 |
| | • වැල්ඩින් වැඩ සඳහා | 1500.00 |
| | • අත් උදවුකරුවන් සඳහා | 1500.00 |
| | • ටයිල් වැඩ සඳහා | 1500.00 |
| XLIV. | සූර්ය පැනල සවි කිරීම සඳහා | 1500.00 |
| XLV . | වාහන සඳහා Tracking Unit සවි කිරීම | 1500.00 |
| XLVI. | පරිගණක පද්ධති සඳහා මෘදුකාංග ස්ථාපනය කිරීම හා සකස් කිරීම | 1500.00 |
| XLVII. | අබලි ද්‍රව්‍ය එක් රැස් කිරීම් මිලදී ගැනීම සඳහා | 1500.00 |

**<u>02) කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු</u>**

| <u>කොන්ත්‍රාත් වටිනාකම (රු)</u> | <u>2026 වසර සඳහා ගාස්තුව (රු)</u> |
|---|---|
| I. 0 - 2,000,000.00 දක්වා | 2,000.00 |
| II. 2,000,0000.00 වැඩි | 5,000.00 |

<u>කොන්දේසි</u>

01.අයදුම්පත සමඟ **<u>ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්ද</u>** ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

02.<u>වැට් සඳහා ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් විසින් 2026 වර්ෂය සඳහා යාවත්කාලීන කරන ලද වලංගු වැට් බදු</u> **<u>සහතිකයේ පිටපතක්</u>** ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

03.ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන අතර,අවස්ථානුකූලව ඉන් බැහැරව මිළ ගණන් කැඳවා භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ අයිතිය ප්‍රාදේශීය සභාව සතුය.

04.ඉල්ලුම් කරන විට මිල ගණන් ඉදිරිපත් නොකරන්නාවූද ඇණවුම් කළ විට කලට වේලාවට භාණ්ඩ භාර නොදෙන්නා වූද සැපයුම්කරුවන්ගේ නම් පූර්ව දැනුම් දීමකින් තොරව ලියාපදිංචි ලේඛනයෙන් කපා හරිනු ලැබේ.

05.2025.12.30 දින ට පසු ලැබෙන අයදුම්පත්‍ර සලකා බලනු නොලැබේ.

**විමසීම:දුරකථන අංකය - 081-2472028**

පී.කේ.ඩී.අනුර ශාන්ත,
සභාපති,
පන්විල ප්‍රාදේශීය සභාව,
පන්විල.